# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

## නිවාඩු නිකේතන රජය හා පෞද්ගලික අංශය එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් ව්‍යාපෘති වාර්තා කැඳවීම.

## (Request for Expression Of Interrest - EOI)

### හැඳින්වීම

01. කොළඹ 07, නිදහස් චතුරස්‍රය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින්, මහියංගනය, පොළොන්නරුව, මුලතිව්, මිහින්තලය, කතරගම හා යාපනය යන ස්ථානයන් හි ඉදිකර ඇති නිවාඩු නේකතන රජය හා පෞද්ගලික අංශය එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියක් (Private Public Partnership - PPP) ලෙස පවත්වාගෙන යාම සඳහා ව්‍යාපෘති වාර්තා කැඳවනු ලැබේ.

02. මෙම නිවාඩු නිකේතන, රජය හා ඒකාබද්ධව පවත්වාගෙන යාම සඳහා උනන්දුවක දක්වන ඕනෑම පාර්ශවයකින් (රජයේ ව්‍යවස්ථාපිත ආයතන, මණ්ඩල, පෞද්ගලික අංශයේ ආයතන හා පුද්ගලයින් අතුරින්) ව්‍යාපෘති වාර්තා කැඳවනු ලැබේ.

03. ව්‍යාපෘති කාලය - වසර 5 කි. මෙම ව්‍යාපෘති කාලය වසර දෙකෙන් දෙකට ඇගයීමට ලක් කරන අතර, ලබා ඇති ප්‍රගතිය මත කාලය දීර්ඝ කිරීම අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

04. අදාළ නිවාඩු නිකේතනයන් හි විස්තර මතු දක්වා ඇති පරිදි වේ.

### කාමර ප්‍රමාණය

| ස්ථානය | මුළු කාමර සංඛ්‍යාව (යාබද නාන කාමර සහිත) | | | රාජ්‍ය අවශ්‍යතා සඳහා රඳවා ගන්නා කාමර ගණන | | | PPP ව්‍යාපෘතියට අදාළ කාමර ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | VIP | A/C | Normal | VIP | A/C | Normal | VIP | A/C | Normal |
| මහියංගනය | 04 | 04 | 17 | 02 | 02 | 01 | 02 | 02 | 16 |
| පොළොන්නරුව | 04 | 05 | 16 | 02 | 02 | 01 | 02 | 03 | 15 |
| මුලතිව් | 04 | 08 | 13 | 02 | 02 | 01 | 02 | 06 | 12 |
| මිහින්තලය | 04 | 05 | 16 | 02 | 02 | 01 | 02 | 03 | 15 |
| යාපනය | 04 | 10 | 11 | 02 | 02 | 01 | 02 | 08 | 10 |
| කතරගම | 04 | 15 | 18 | 02 | 02 | 01 | 02 | 03 | 17 |

### අනෙකුත් පහසුකම්

| පහසුකම් / ස්ථානය | සූර්ය බල | ජල මණ්ඩල සැපයුම | පිරිපහදු යන්ත්‍ර මගින් ජල සැපයුම | ගැඹුරු නළ ළිං | ළිං ජලය | භාරකරු, කම්කරු හා රියැදුරු කාමර |
|---|---|---|---|---|---|---|
| යාපනය | ✓ | - | ✓ | ✓ | - | ✓ |
| කතරගම | ✓ | ✓ | ✓ | - | - | ✓ |
| මිහින්තලය | ✓ | ✓ | - | ✓ | - | ✓ |
| මුලතිව් | ✓ | - | ✓ | ✓ | - | ✓ |
| පොළොන්නරුව | ✓ | ✓ | - | - | ✓ | ✓ |
| මහියංගනය | ✓ | ✓ | - | ✓ | - | ✓ |

- සියලුම කාමර ගෘහ භාණ්ඩවලින් අංග සම්පූර්ණ වන අතර, සෑම කාමරයකම විදුලි පංකා සවිකර ඇත.
- වායු සමනය කරන ලද ද්විත්ව කාමර (VIP) 04 කි Pantry Area හා ලොබියකින් සමන්විත වන අතර, චන්ද්‍රිකා සම්බන්ධතාවය සහිත රූපවාහිනී යන්ත්‍රයක්, විදුලි ස්ත්‍රික්කයක්, විදුලි කේතලයක් හා තේ සෑදීමට අවශ්‍ය පෝසිලේන් කට්ටලයක් ද සහිත වේ.
- පුද්ගලයින් 50 දෙනෙකු සඳහා ප්‍රමාණවත් වන ආහාර ගැනීමේ ශාලා (Dinning area) 02 ක් ඇත.
- සියලුම විදුලි උපකරණ (ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, Blender, Rice Cooker, Oven, Iron, Electric Kettle, Four Burner.... හා පිඟන් භාණ්ඩ පවතින අතර අංගසම්පූර්ණ මුළුතැන්ගෙයකින් ද සමන්විත වේ.

05. ඉහත සඳහන් නිවාඩු නිකේතනය රජය හා එක්ව ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන් හට **2017 ඔක්තෝබර් 30 වන දින සිට 2017 නොවැම්බර් 14 දින** දක්වා අදාළ නිවාඩු නිකේතනය නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබාදෙන අතර, **2017 නොවැම්බර් 16 දින පෙ.ව. 10.00ට** ලේකම් කාර්යාලයේදී විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරනු ඇත.

06. වැඩිමනත් විස්තර දුරකථන අංක 011-3288277, 0112186511 මගින් හා අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.pubad.gov.lk/ Bangalow Booking මගින් ලබාගැනීමට ද පුළුවන.

07. මුද්‍රා තබන ලද ව්‍යාපෘති වාර්තා කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ, 4 වැනි මහලේ, ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ, ලේකම් වෙත **2017 නොවැම්බර් 21 දින ප.ව. 2.00 ට** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ව්‍යාපෘති වාර්තා ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් බලය පැවරූ නිලධාරියෙකුට සහභාගී විය හැකිය.

**සභාපති, (අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව)**
**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,**
**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.**
2017.10.25